අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# හින්දී භාෂාව

12 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2009 වසරේ සිට ක්‍රියාත්මකයි)

ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

නිපුණතා පාදක කර ගත් අ.පො.ස. (උ. පෙ.) හින්දී විෂය නිර්දේශානුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත. මෙහි ඇතුළත් තොරතුරු උසස් පෙළ හින්දී විෂය උගන්වනු ලබන ගුරු මහත්ම-මහත්මීන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම පහසු කරවනු ඇත. විෂය නිර්දේශය ප්‍රධාන නිපුණතා 10කින් සමන්විත වෙයි. එයින් නිපුණතා 04ක් 12වන ශ්‍රේණිය සඳහා වන අතර නිපුණතා 06ක් 13වන ශ්‍රේණිය සඳහා වෙයි. එක් එක් නිපුණතාවලට අදාළ ව නිපුණතා මට්ටම් ඇතුළත් කර ඇත. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පහත සඳහන් ශීර්ෂ යටතේ සකස් කර ඇත.

1.0 නිපුණතා

විෂය නිර්දේශයේ 12වන ශ්‍රේණිය සඳහා අදාළ වන එක් එක් නිපුණතාව මේ යටතේ දක්වා ඇත.

2.0 නිපුණතා මට්ටම්

පූර්වෝක්ත නිපුණතාව කරා ළඟා විය හැකි නිපුණතා මට්ටම් මෙයට ඇතුළත් වෙයි.

3.0 කාලඡේද එකතුව

ඉහත දැක්වූ නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී යෝජිත කාලච්ඡේද සංඛ්‍යාව සුදුසු පරිදි වෙනස් කර ගැනීමේ අවකාශ පවතී.

4.0 ඉගෙනුම් ඵල

එක් එක් නිපුණතාවට අදාළ ව හින්දී විෂය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අවසානයේ අපේක්ෂිත සිසු චර්යා වෙනස්කම් මේ යටතේ ඉදිරිපත් කර ඇත. අදාළ ක්‍රියාකාරකම් තක්සේරුකරණ නිර්ණායක වශයෙන් ද භාවිත කළ හැක.

5.0 ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්

එක් එක් නිපුණතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා නිපුණතා මට්ටම්වලට අදාළ විෂය අන්තර්ගතය කෙටියෙන් මේ යටතේ දක්වා ඇත. විෂය අන්තර්ගතය පිළිබඳ කරුණු අවසානයේ අදාළ නිපුණතා මට්ටම් වෙත සිසුන් ළඟා කර ගැනීමට උපකාරී වන ක්‍රියාකාරකම් කිහිපයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාකාරකම් වෙන්කර ගැනීමේ දී නිර්මාණාත්මක නව ක්‍රියාකාරකම් සකස් කර ගැනීමේ ද අවකාශය ගුරු මහත්ම මහත්මීන් සතු කාර්යයකි.

6.0 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමක් ඉදිරිපත් කර ඇත. සිසු ගවේෂණය මගින් කරුණු රැස්කර ගැනීමට පෙළඹුමක් ඇතිවන පරිදි එම ඇගයුම් සැලසුම් කර තිබේ. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති ඇගයීම් පාසල් පාදක ඇගයීම් සඳහා යොදා ගත යුතුය. වාරයකට ඇගයීම් අවස්ථා 03 බැගින් වාර තුන සඳහා ඇගයීම් 09ක් ඉදිරිපත් කර ඇත.

7.0 මූලාශ්‍රය

එක් එක් නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉදිරිපත් කර ඇති විෂය අන්තර්ගතය ප්‍රසාරණය කර ගැනීම සඳහා විෂය නිර්දේශයේ සඳහන් පරිශීලන ග්‍රන්ථ සහ වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මූලාශ්‍රය ලෙස භාවිත කිරීමට අවස්ථාව ඇත.

# 12 ශ්‍රේණිය

1. නිපුණතාව : 1.0- හින්දී භාෂක කලාපය හඳුනාගනියි.

2. නිපුණතා මට්ටම : 1.1 - භාරතයේ ව්‍යවහාර වන භාෂා සහ හින්දී භාෂක කලාපය නම් කරයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 06 යි.

4. ඉගෙනුම් ඵල :

i. භාරතයේ භූගෝලීය පිහිටීම විස්තර කරයි.

ii. භාරතයේ ප්‍රාන්ත නම් කරයි.

iii. එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව නම් කරයි.

iv. හින්දී භාෂාව, සංස්කෘත භාෂාවෙන් විකාසය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව කියයි.

v. හින්දී භාෂක කලාපය, සිතියමක නම් කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය භාෂා යන මූලික වර්ගීකරණය යටතේ ඉන්දියාවේ ව්‍යවහාර වන ප්‍රධාන භාෂා හඳුන්වා දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පහත සඳහන් තොරතුරු මතුවන සේ සාකච්ඡාවක යෙදෙන්න.

- භාරතය අපට ආසන්න ම රට වන බව.
- එහි විවිධ ප්‍රාන්තවල විවිධ භාෂා කථා කරන බව.
- එම භාෂා අතරින් හින්දී භාෂාව ප්‍රධාන භාෂාව වන බව.
- හින්දී භාෂාව ප්‍රාන්ත කිහිපයක ම වෙසෙන ජනතාවගේ මව් භාෂාව වන බව.
- හින්දී භාෂාව භාරතයේ ජාතික භාෂාව වන බව.

පියවර 1 - • භාරතයේ භූගෝලීය පිහිටීම හා ප්‍රාන්තීය බෙදීම දැක්වෙන සිතියමක් සිසුන් අතට ලබා දෙන්න.

පියවර 2 - • දෘශ්‍ය මාධ්‍යයන් භාවිත කරමින් එම සිතියම පන්ති කාමරයෙහි ප්‍රදර්ශනය කරන්න.

පියවර 3 - • සිතියම ආධාරයෙන් භාරතීය භාෂා වර්ගීකරණයක යෙදෙන්න.

පියවර 4 - • එම වර්ගීකරණයට අනුව සිසුන් ලවා සිතියමක ලකුණු කිරීමට සලස්වන්න.

පියවර 5 - • හින්දී භාෂක කලාපය ලකුණු කිරීමට සලස්වන්න.

**7. මූලාශ්‍රය :**

- පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- භාරතයේ භූගෝලීය පිහිටීම විස්තර කරන්න.
- නූතන භාෂා කිහිපයක් නම් කරන්න.
- හින්දී භාෂක කලාපයට අයත් ප්‍රාන්ත හා සාංගමික රාජ්‍ය නම් කරන්න.
- හින්දියේ කලාපීය උපභාෂා නම් කරන්න.

1. **නිපුණතාව** : 2.0 - හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

2. **නිපුණතා මට්ටම** : 2.1 - වර්ණ මාලාව නිවැරදි ව උච්චාරණය කරයි.

3. **කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි.

4. **ඉගෙනුම් ඵල** :

i. ස්වර හා ව්‍යඤ්ජන නිවැරදි ව උච්චාරණය කරයි.

ii. अ, ऋ, ऐ, औ යන ස්වරවල විශේෂතා හඳුනාගෙන උච්චාරණය කරයි.

iii. ण, य, व, ष, ह, ज्ञ ව්‍යඤ්ජනවල විශේෂතා හඳුනාගෙන උච්චාරණය කරයි.

iv. අනුස්වාරය, අර්ධ අනුස්වාරය හා මහප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.

v. क़, ख़, ग़, ज़, फ़ ව්‍යඤ්ජනවල විශේෂතා හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.

vi. ड़, ढ़ යන උත්ක්ෂිප්ත ව්‍යඤ්ජනවල විශේෂතා හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල** :

- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය භාවිත කරමින් උච්චාරණ විශේෂතා හඳුන්වා දෙන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- अ, ऋ, ऐ, औ ස්වර උච්චාරණයේ විශේෂතා ඇති බව.
- ण, य, व, ष, ह, ज्ञ ව්‍යඤ්ජන උච්චාරණයේ විශේෂතා ඇති බව.
- මහප්‍රාණ ව්‍යඤ්ජන වෙනුවට අල්පප්‍රාණ ව්‍යඤ්ජන උච්චාරණය නොකළ යුතු බව.
- අර්ධ අනුස්වාරය වෙනුවට අනුස්වාරය උච්චාරණය නොකළ යුතු බව.
- क़, ख़, ग़, ज़, फ़, ड़, ढ़ ව්‍යඤ්ජනවලට නිසි නිවැරදි උච්චාරණය කළ යුතු බව.

පියවර 1 - • පරිසර බද්ධ ව अ, ऋ, ऐ, औ ස්වර උච්චාරණයේ වෙනස්කම් පහදා දී සිසුන් ලවා උච්චාරණය කරවන්න.

පියවර 2 - • ण, ज्ञ ව්‍යඤ්ජන උච්චාරණ විශේෂතා පැහැදිලි කර දෙන්න. (කේවල ව හා වචන ඇසුරෙන්)

පියවර 3 - • අල්පප්‍රාණ හා මහප්‍රාණ අක්ෂර අතර උච්චාරණ වෙනස පැහැදිලි කර දෙන්න. (කේවල ව හා වචන ඇසුරෙන්)

පියවර 4 - • क़, ख़, ग़, ज़, फ़, ड़, ढ़ ව්‍යඤ්ජනවල උච්චාරණ විශේෂතා පැහැදිලි කර දෙන්න.

**7. මූලාශ්‍රය :** • පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

• හින්දී වර්ණ මාලාව උච්චාරණය කර පෙන්වන්න.

1. නිපුණතාව : 2.0 - හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

2. නිපුණතා මට්ටම : 2.2 - හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 05 යි.

4. ඉගෙනුම් ඵල :

i. පදන්ත ව්‍යඤ්ජනය හලන්ත ව උච්චාරණය කරයි.
ii. ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කරයි.
iii. ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කරයි.
iv. य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කරයි.
v. व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

ඉහත උච්චාරණ විශේෂතා පෙන්නුම් කරන වචනවල ලේඛන සහ උච්චාරණ වෙනස පැහැදිලි කර දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- පදන්ත ව්‍යඤ්ජනය හලන්ත ව උච්චාරණය කළ යුතු බව.
- ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කළ යුතු බව.
- ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කළ යුතු බව.
- य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කළ යුතු බව.
- व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කළ යුතු බව.

පියවර 1 - • ඉහත උච්චාරණ රටාවන්ට අදාළ උදාහරණ ප්‍රදර්ශනය කරන්න.
පියවර 2 - • විශේෂ ලක්ෂණ ඇති වචන නිවැරදි ලෙස උච්චාරණය කර පෙන්වන්න.
පියවර 3 - • සිසුන් ලවා එම වචන උච්චාරණය කරවන්න.

7. මූලාශ්‍රය : • අදාළ උච්චාරණය සහිත ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. නිපුණතා පාදක තක්සේරුව :

- වචන මාලාවක් සිසුන්ට ලබා දී සිසුන් ලවා උච්චාරණය කරවන්න.
  පැවරුම
- එවැනි උච්චාරණ විශේෂතා ඇති වචන මාලාවක් පිළියෙළ කරන්න.

1. නිපුණතාව : 2.0 - හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

2. නිපුණතා මට්ටම : 2.3 - හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 04 යි.

4. ඉගෙනුම් ඵල :

i. භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කරයි.
ii. භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා අනුතානය සහිත ව වාක්‍ය උච්චාරණය කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- එක ම වාක්‍යය ආඝාතය වෙනස් කරමින් උච්චාරණය කර පෙන්වා එහි අර්ථයේ වෙනස පැහැදිලි කර දෙන්න.

උදා: मुझे <u>एक</u> खिड़कीवाला मकान चाहिए।

मुझे <u>खिडकीवाला</u> मकान चाहिए।

ඉහත පළමු වාක්‍යයෙහි एक යන වචනය මත ආඝාතය යොදා උච්චාරණය කළ විට අර්ථවත් වන්නේ එක ජනේලයක් ඇති නිවසක් අවශ්‍ය බවයි.

දෙවන වාක්‍යයෙහි खिड़कीवाला යන වචනය මත ආඝාතය යොදා උච්චාරණය කළ විට අර්ථවත් වන්නේ ජනෙල් සහිත නිවසක් බවයි.

- අනුතානය : आज रविवार है। මෙය සාමාන්‍ය ප්‍රකාශන වාක්‍යයකි.
  आज रविवार है ? මෙය ප්‍රශ්නවාචී වාක්‍යයකි.
  आज रविवार है ! මෙය විශ්මය දනවන වාක්‍යයකි.

උක්ත වෙනස එක ම වාක්‍යයෙහි අනුතානය වෙනස් කිරීමෙන් ඇති කළ යුතුයි.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- ආඝාතය සහ අනුතානය අර්ථ සන්නිවේදනය සඳහා වැදගත් වන බව.

පියවර 1- • ආඝාතය සහ අනුතාන සහිත වාක්‍ය උච්චාරණය කර පෙන්වා එහි අර්ථමය වෙනස පැහැදිලි කර දෙන්න.

පියවර 2- • සිසුන් ලවා උච්චාරණය කරවන්න.

7. මූලාශ්‍රය :
- ශ්‍රව්‍ය- දෘශ්‍ය මාධ්‍ය
- හින්දී සංවාද ඇතුළත් අන්තර්ජාලයේ වෙබ් අඩවි

8. නිපුණතා පාදක තක්සේරුව :

- ආඝාතය සහ අනුතානය සහිත වාක්‍ය උච්චාරණය කර ගම්‍ය වන අර්ථය විමසන්න.

1. නිපුණතාව : 3.0 - සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

2. නිපුණතා මට්ටම : 3.1 - සවන් දී හින්දී ශබ්ද හඳුනාගනියි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 09 යි.

4. ඉගෙනුම් ඵල :

i. අල්පප්‍රාණ සහ මහප්‍රාණ අකුරුවල උච්චාරණයන්ට සවන් දී ඒවායෙහි වෙනස හඳුනාගෙන ප්‍රකාශ කරයි.

ii. अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල උච්චාරණයන්ට සවන් දී සිංහල භාෂාවෙන් වෙනස්වන අයුරු ප්‍රකාශ කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- අල්පප්‍රාණ සහ මහප්‍රාණ අකුරුවල උච්චාරණ වෙනස පැහැදිලි වන ආකාරයට අකුරු උච්චාරණය කර සිසුන්ට සවන් දීමට සලස්වන්න.

- अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල සිංහල භාෂාවේ උච්චාරණය සහ හින්දී භාෂාවේ උච්චාරණය අතර වෙනස අවබෝධ කර දී සවන්දීමට සලස්වන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- අල්පප්‍රාණ සහ මහප්‍රාණ අකුරුවල උච්චාරණ වෙනස සවන් දීමෙන් අවබෝධ කර ගත යුතු බව.

- अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල සිංහල උච්චාරණයෙහි සහ හින්දී උච්චාරණයෙහි වෙනස සවන් දීමෙන් අවබෝධ කර ගත යුතු බව.

පියවර 1 - • හින්දී වර්ණමාලාව පංති කාමරයෙහි ප්‍රදර්ශනය කරන්න.

පියවර 2 - • හින්දී වර්ණමාලාව උච්චාරණය කර සිසුන්ට සවන් දීමට සලස්වන්න.

පියවර 3 - • සිංහල භාෂාව හා සැසඳීමේ දී හින්දී භාෂාවේ අල්පප්‍රාණ, මහප්‍රාණ සහ अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල උච්චාරණ වෙනස අවධාරණය කරමින් සවන් දීමට සලස්වන්න.

7. මූලාශ්‍රය :

- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය
- හින්දී සංවාද ඇතුළත් අන්තර්ජාලයේ වෙබ් අඩවි

8. නිපුණතා පාදක තක්සේරුව :

- කේවල හෝ කණ්ඩායම් වශයෙන් යෝග්‍ය ක්‍රියාකාරකම් ලබා දෙන්න.

1. නිපුණතාව : 3.0 - සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

2. නිපුණතා මට්ටම : 3.2 - සවන් දී හින්දී වචන හඳුනාගනියි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 04 යි.

4. ඉගෙනුම් ඵල :

i. වචනාන්ත ව්‍යඤ්ජනය හල් ව උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

ii. ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

iii. ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

iv. य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

v. व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

vi. අනුස්වාරය හා අර්ධානුස්වාරය අතර ඇති වෙනස උච්චාරණයට සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- ඉහත උච්චාරණ විශේෂතා දක්වෙන වචන මාලාවක් උච්චාරණය කොට සිසුන්ට සවන් දීමට සලස්වා උච්චාරණ වෙනස අවබෝධ කර දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- වචන උච්චාරණයට අවධානයෙන් සවන් දී එහි ඇති උච්චාරණ විශේෂතා හඳුනාගත යුතු බව.

පියවර 1 - • ඉහත ඉගෙනුම් ඵලවලට අදාළ උදාහරණ සපයා ගන්න.

පියවර 2 - • එම වචනවල ලේඛනයේ සහ උච්චාරණයේ ඇති වෙනස්කම් සවන් දීම මගින් අවබෝධ කර ගැනීමට සලස්වන්න.

7. මූලාශ්‍රය : • ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. නිපුණතා පාදක තක්සේරුව :

- කේවල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් යෝග්‍ය ක්‍රියාකාරකම් ලබා දෙන්න.

1. නිපුණතාව : 3.0 - සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

2. නිපුණතා මට්ටම : 3.3 - වාක්‍යවලට සවන් දී අර්ථාවබෝධයෙන් ප්‍රතිචාර දක්වයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 06 යි.

4. ඉගෙනුම් ඵල :

i. වාක්‍යවලට සවන් දී අර්ථය ප්‍රකාශ කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- වාක්‍ය විවිධාර්ථ දනවන පරිදි උච්චාරණය කොට සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- උච්චාරණය අනුව අර්ථ වෙනස් වීම පිළිබඳ සාකච්ඡා කරන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- වාක්‍යවලට අවධානයෙන් සවන් දීමෙන් එහි අර්ථය අවබෝධ කර ගත යුතු බව.

පියවර 1 -
- එක් වාක්‍යයක් විවිධ අර්ථ දනවෙන පරිදි (ප්‍රකාශන, ප්‍රශ්න, විස්මයාදි) උච්චාරණය කර සිසුන්ට සවන් දීමට සලස්වන්න.

පියවර 2 -
- එම වාක්‍යයෙන් ප්‍රකාශවන අර්ථය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

7. මූලාශ්‍රය :
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. නිපුණතා පාදක තක්සේරුව :

- කේවල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් සිසුන් යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

1. **නිපුණතාව** : 3.0 - සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

2. **නිපුණතා මට්ටම** : 3.4 - සරල ඡේදයකට සවන් දී අර්ථාවබෝධයෙන් ප්‍රතිචාර දක්වයි.

3. **කාලච්ඡේද සංඛ්‍යාව** : 10 යි.

4. **ඉගෙනුම් ඵල** :

   i. ඡේදයකට සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :**

- සිසුන්ගේ භාෂා ඥානයට යෝග්‍ය සරල ඡේද සවන් දීමට සලස්වා ප්‍රශ්න ඉදිරිපත් කර පිළිතුරු විමසන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- නිවැරදි අර්ථාවබෝධය සඳහා අවධානයෙන් සවන් දිය යුතු බව.

පියවර 1 - • සරල ගද්‍ය ඡේදයක් සිසුන්ට සවන් දීමට සලස්වන්න.

පියවර 2 - • ඡේදය සම්බන්ධයෙන් ප්‍රශ්න විමසන්න.

පියවර 3 - • පිළිතුරු සාකච්ඡා කරන්න.

7. **මූලාශ්‍රය :** • සරල ගද්‍ය කොටස්

8. **නිපුණතා පාදක තක්සේරුව :**

- ප්‍රශ්නාවලියක් ලබා දී ගද්‍ය ඡේදයක් සවන් දීමට සලස්වන්න.
- පිළිතුරු ලබා ගන්න.

1. නිපුණතාව : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

2. නිපුණතා මට්ටම : 4.1 - අවස්ථානුකූල ව ආචාරවිධි භාවිත කරයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 06 යි.

4. ඉගෙනුම් ඵල :

i. පූජකයෙකුට ආචාර කරයි.
ii. වැඩිහිටියෙකුට ආචාර කරයි.
iii. තමා හා සමාන පුද්ගලයෙකුට ආචාර කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- විවිධ පුද්ගලයින් හමුවීමක දී සහ වෙන්වීමක දී ආචාර කරන ආකාරය පැහැදිලි කරන්න.
- වාග්කෝෂ ඥානය ලබා දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- ආචාරවිධිවල විවිධත්වයක් ඇති බව.

පියවර 1 -
- විවිධ පුද්ගලයින් හමුවීමක දී සහ වෙන්වීමක දී ආචාර කරන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

පියවර 2 -
- කණ්ඩායම් වශයෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.

7. මූලාශ්‍රය :
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය
- විෂයට අදාළ අන්තර්ජාලයේ වෙබ් අඩවි

8. නිපුණතා පාදක තක්සේරුව :
- යුගල වශයෙන් යෝග්‍ය අභ්‍යාස ලබා දෙන්න.

1. නිපුණතාව : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

2. නිපුණතා මට්ටම : 4.2 - පුද්ලයන් හඳුනා ගනියි. හඳුන්වා දෙයි.

3. කාලච්ඡේද : 08 යි.

4. ඉගෙනුම් ඵල :

i. තමන් හඳුන්වා දෙයි.
ii. වෙනත් කෙනෙකු හඳුන්වා දෙයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- තමා සහ වෙනත් කෙනෙකු හඳුන්වා දෙන ආකාරය පිළිබඳ ආදර්ශයක් ලබා දෙන්න.
- අදාළ වාග්කෝෂ ඥානය ලබා දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- හඳුන්වා දීමේ දී හෝ හඳුනා ගැනීමේ දී සර්වනාම නිවැරදි ව භාවිත කළ යුතු බව.

පියවර 1 - ● ගුරුවරයා තමා පිළිබඳ සිසුන්ට හැඳින්වීමක් කරන්න.

පියවර 2 - ● එම ආර්ශය අනුව සිසුන්ට තමා ගැන හැඳින්වීමක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3 - ● වෙනත් කෙනෙකු හඳුන්වා දෙන ආකාරය ආදර්ශයක් මගින් සිසුන්ට පැහැදිලි කර දෙන්න.

7. මූලාශ්‍රය : ● ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. නිපුණතා පාදක තක්සේරුව :

- එක් එක් සිසුවාට පංතිය ඉදිරියේ තමා පිළිබඳ සහ තමාගේ මිතුරා පිළිබඳ හැඳින්වීමක් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

1. **නිපුණතාව** : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

2. **නිපුණතා මට්ටම** : 4.3 - පෞද්ගලික තොරතුරු විමසයි.

3. **කාලච්ඡේද** : 10 යි.

4. **ඉගෙනුම් ඵල** :

   i. ප්‍රශ්නවාචක පද භාවිත කරමින් භාෂණයේ යෙදෙයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :**

- ප්‍රශ්නවාචක පද භාවිත කරන ආකාරය පැහැදිලි කර දෙන්න.
- ප්‍රශ්නවාචක පදවල ව්‍යාකරණමය වෙනස්වීම පැහැදිලි කර දෙන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ප්‍රශ්නවාචක පද භාවිතයේ දී ඒවායේ සිදුවන රූපීය වෙනස්කම් හඳුනාගත යුතු බව.

පියවර 1 - • ප්‍රශ්නවාචක පද භාවිත කරමින් සිසුන්ගෙන් ප්‍රශ්න විමසන්න.

පියවර 2 - • ප්‍රශ්නවාචක පදවල රූපීය වෙනස්කම් සිදුවන ස්ථාන හඳුන්වා දෙන්න.

පියවර 3 - • එකිනෙකාගෙන් ප්‍රශ්න විමසීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.

7. **මූලාශ්‍රය :** • ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. **නිපුණතා පාදක තක්සේරුව :**

- ප්‍රකාශන වාක්‍ය ලබා දී එයට අදාළ ප්‍රශ්නය ගොඩනැගීමට අවස්ථාව සලසා දෙන්න.

1. **නිපුණතාව** : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

2. **නිපුණතා මට්ටම** : 4.4 - අවස්ථානුකූල ව සුබ පතයි.

3. **කාලච්ඡේද** : 04 යි.

4. **ඉගෙනුම් ඵල** :

i. අවස්ථාව හඳුනාගෙන සුදුසු ලෙස සුබ පතයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල** :

- बधाई / शुभ कामनाए; / मुबारक ආදි වචන යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- අවස්ථානුකූල ව සුබ පැතීමේ වදන් යොදා ගත යුතු බව.

පියවර 1 -
- සුබ පැතීමේ ආදර්ශයක් සිසුන්ට ලබා දෙන්න.

පියවර 2 -
- ආදර්ශයන්ට අනුව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.

7. **මූලාශ්‍රය** :
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. **නිපුණතා පාදක තක්සේරුව** :

- සුදුසු අවස්ථාවල දී සුබ පතන ආකාරය විමසන්න.

1. **නිපුණතාව** : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

2. **නිපුණතා මට්ටම** : 4.5 - හැඟීම් ප්‍රකාශ කරයි.

3. **කාලච්ඡේද** : 06 යි.

4. **ඉගෙනුම් ඵල** :

   i. හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා භාවිතවන වාක්‍ය රටා හඳුනාගෙන භාෂණයේ යෙදෙයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :**

- वाह, शाबाश, बापरे, अरे, क्या बात है වැනි යෙදුම් සහ लगना, चाहना, पसंद करना, दर्द, अफ़सोस වැනි පද යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- හැඟීම් ප්‍රකාශනයේ දී උච්චාරණ ශෛලියෙහි වෙනස්කම් සිදුවන බව.
- හැඟීම් ප්‍රකාශනයේ දී ඒ ඒ අවස්ථාවට අනුව විවිධ යෙදුම් සඳහා වාක්‍ය රටා යෙදෙන බව.

පියවර 1 -
- හැඟීම් ප්‍රකාශනයේ දී යෙදුම් සහ වාක්‍ය රටා පිළිබඳ ආදර්ශ සිසුන්ට ලබා දෙන්න.

පියවර 2 -
- මෙම ආදර්ශයන්ට අනුව සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.

7. **මූලාශ්‍රය :**
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. **නිපුණතා පාදක තක්සේරුව :**

- හැඟීම් ප්‍රකාශ කළ හැකි විවිධ අවස්ථාවන් සිසුන්ට ලබා දී ඒ සම්බන්ධ ව සිසුන්ගෙන් විමසන්න.
- දෙනු ලබන චිත්‍ර/පරිසරය/සිද්ධි ඇසුරින් අදහස් ප්‍රකාශ කරන්න.

1. **නිපුණතාව** : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.
2. **නිපුණතා මට්ටම** : 4.6 - ආචාරශීලි ව කථා කරයි.
3. කාලච්ඡේද : 10 යි.
4. **ඉගෙනුම් ඵල** :

   i. ආචාරශීලි බව ප්‍රකාශ කෙරෙන යෙදුම් භාවිත කරමින් භාෂණයේ යෙදෙයි.

5. **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල** :

   - ස්තුති කිරීම, සමාව ගැනීම, අවසර ගැනීම සහ ඔව් සහ බැහැ යනුවෙන් ප්‍රකාශ කිරීමේ දී යෙදෙන යෙදුම් පැහැදිලි කර දෙන්න.

6. **ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

   - ආචාරශීලී ලෙස භාෂණයේ යෙදිය යුතු බව.
   - ඒ සඳහා විශේෂිත වූ යෙදුම් ඇති බව.

   පියවර 1-
   - සංවාදයක් ඇසුරින් ආචාරශීලි ව කථා කෙරෙන ආකාරය පැහැදිලි කර දෙන්න.

   පියවර 2 -
   - සිසුන්ට ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව ලබා දෙන්න.

7. **මූලාශ්‍රය** :
   - ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. **නිපුණතා පාදක තක්සේරුව** :

   - මේ සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම් ලබා දෙන්න.

1. **නිපුණතාව** : 4.0 - නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.
2. **නිපුණතා මට්ටම** : 4.7 - සංවාදයේ යෙදෙයි.
3. **කාලච්ඡේද** : 14 යි.
4. **ඉගෙනුම් ඵල** :

i. විවිධ සේවා ස්ථානවල දී සහ විවිධ පුද්ගලයින් සමග භාෂණයේ යෙදෙයි.

**5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විෂය නිර්දේශයෙහි අන්තර්ගත අවස්ථාවලට ගැළපෙන සංවාද ගොඩනංවන්න.
- අදාළ භාෂා ඥානය ලබා දෙන්න.

**6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- විවිධ අවස්ථාවන්ට අනුකූල ව භාෂණයේ වෙනස්කම් ඇති බව.

පියවර 1 - • ආදර්ශ සංවාද සිසුන්ට ලබා දෙන්න.
පියවර 2 - • තේමාවක් ලබා දී ඊට අදාළ වාග්කෝෂ ඥානය ලබා දෙන්න.
පියවර 3 - • සිසුන්ට සංවාද ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න.

**7. මූලාශ්‍රය :** • ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- සංවාද ගොඩනැගීමට තේමාවන් ලබා දෙන්න.

1. නිපුණතාව : 5.0 - කියවා ප්‍රතිචාර දක්වයි.
2. නිපුණතා මට්ටම : 5.1 - ශබ්දනගා කියවයි.

3. කාලච්ඡේද : 10 යි.

4. ඉගෙනුම් ඵල :

i. වචන පැහැදිලි ව උච්චාරණය කරමින් කියවයි.

ii. අවබෝධයෙන් යුතු ව හඬ පාලනය කරමින් කියවයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

පහත සඳහන් කරුණු පැහැදිලි කර දෙන්න.

- අකුරුවල උච්චාරණ විශේෂතා අවබෝධ කරගෙන කියවිය යුතු බව.
- අවබෝධයෙන් යුතු ව අදාළ පාඨය කියවිය යුතු බව.
- විෂය අන්තර්ගතයට අනුව උච්චාරණ ශෛලියෙහි වෙනස්කම් ඇති බව.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- අකුරුවල උච්චාරණ විශේෂතා අවබෝධ කරගෙන කියවිය යුතු බව.
- අවබෝධයෙන් යුතු ව අදාළ පාඨය කියවිය යුතු බව.
- විෂය අන්තර්ගතයට අනුව උච්චාරණ ශෛලියෙහි වෙනස්කම් ඇති බව.

පියවර 1 - • තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය කොටස් සිසුන්ට ලබා දෙන්න.
පියවර 2 - • ගුරුවරයා එම ගද්‍ය පද්‍ය කොටස් සිසුන්ට ලබා දෙන්න.
පියවර 3 - • ගුරුවරයා සහ සිසුන් එක් ව කියවන්න.
පියවර 4 - • සිසුන් ලවා කියවීමට සලස්වන්න.

7. මූලාශ්‍රය :
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය
- ගද්‍ය-පද්‍ය පාඨ

8. නිපුණතා පාදක තක්සේරුව :

- විවිධ ගද්‍ය පද්‍ය කොටස් කියවීමට ලබා දී ප්‍රශ්න අසන්න.

1. නිපුණතාව : 5.0 - කියවා ප්‍රතිචාර දක්වයි.
2. නිපුණතා මට්ටම : 5.2 - නිශ්ශබ්ද ව කියවා අර්ථය අවබෝධ කර ගනියි.

3. කාලච්ඡේද : 06 යි.

4. ඉගෙනුම් ඵල :

i. දෙන ලද පාඨය කියවා නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
  - ⋆ දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දිය යුතු බව.
  - ⋆ වචනවල අර්ථය සංදර්භයට අනුව වෙනස් වන බව.
  - ⋆ පද සමග යෙදිය හැකි වෙනත් සමාන පද ඇති බව.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දිය යුතු බව.
- වචනවල අර්ථය සංදර්භයට අනුව වෙනස් වන බව.
- පද සමග යෙදිය හැකි වෙනත් සමාන පද ඇති බව.

පියවර 1 - • අදාළ ගද්‍ය හෝ පද්‍ය කොටස සිසුන්ට ලබා දෙන්න.
පියවර 2 - • ඊට අදාළ ප්‍රශ්නාවලියක් ලබා දී පිළිතුරු ලිවීමට සලස්වන්න.
පියවර 3 - • සිසුන් සමග පිළිතුරු සාකච්ඡා කරන්න.

7. මූලාශ්‍රය :
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය
- ගද්‍ය-පද්‍ය පාඨ

8. නිපුණතා පාදක තක්සේරුව :

- නිශ්ශබ්ද ව කියවීමට ඡේදයක් ලබා දී ප්‍රශ්න අසන්න.

1. නිපුණතාව : 6.0 - මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.1 - නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍ය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

3. කාලච්ඡේද : 10 යි.

4. ඉගෙනුම් ඵල :

i. නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍ය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- වචන භේදය, ලිංග භේදය, සර්වනාම, විශේෂණ, විභක්ති යන ව්‍යාකරණාංග සම්බන්ධ ව්‍යාකරණ නියම පැහැදිලි කරන්න.

<u>වචන භේදය</u> :-
★ ඒකවචනය, බහුවචනය සාදා ගන්නා නීති රීති පැහැදිලි කරන්න.
★ බහුවචනවල ගැන්වී ඇති ප්‍රත්‍යයට අනුව, ලිංගය කුමක්දැයි හඳුනා ගැනීමට සලස්වන්න.

<u>ලිංග භේදය</u> :- පුරුෂ වාචක නාමපද සඳහා ස්ත්‍රී වාචක පද සහ ස්ත්‍රී වාචක නාමපද සඳහා පුරුෂ වාචක පද සාදා ගැනීමේ නියමයන් දක්වන්න.

<u>සර්වනාම</u> :-
★ පුරුෂත්‍රයට අදාළ සර්වනාම සහ ඊට අදාළ සහායක ක්‍රියා පැහැදිලි කරන්න.
★ ප්‍රශ්නවාචී සර්වනාම පද භාවිතය පැහැදිලි කරන්න. (क्या, कौन, कहाँ, किधर, कब, क्यों, कैसा, कितना, कौन-सा, किसका, किनका)
★ कोई - අනිශ්චය වාචක සර්වනාම පදය භාවිතය පැහැදිලි කරන්න.

<u>විශේෂණ</u> :- විශේෂ්‍යයේ ලිංග, වචන, කාරක භේදය අනුව විශේෂණ භාවිත වන ආකාරය පැහැදිලි කරන්න.

<u>විභක්ති</u> :-

| | |
|---|---|
| කර්ම - | को |
| කරණ - | से |
| අපාදාන (අවධි) - | से |
| ආධාර - | में /पर |
| සම්බන්ධ - | का/ के/ की |

විභක්ති ප්‍රත්‍ය ගැන්වීමේ දී නාමපදවල සහ සර්වනාම පදවල සිදුවන වෙනස්කම් පැහැදිලි කරන්න.

**6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- හින්දී භාෂාවේ වචන භේදය, ලිංග භේදය ඇති බව.
- පුරුෂත්‍රයට අදාළ සර්වනාම සහ ඊට අදාළ සහායක ක්‍රියා ඇති බව.
- විශේෂ්‍යයේ ලිංග, වචන, කාරක භේදය අනුව විශේෂණ භාවිත වන බව.
- නාමපදවල සහ සර්වනාම පදවල වෙනස්කම් ඇති බව.
- එකම විභක්ති ප්‍රත්‍යයට විවිධ අර්ථ තිබෙන බව.

පියවර 1 - • හින්දී භාෂාවේ වචන භේදය, ලිංග භේදය හඳුන්වන්න.

පියවර 2 - • පුරුෂත්‍රයට අදාළ සර්වනාම සහ ඊට අදාළ සහායක ක්‍රියා හඳුන්වන්න.

පියවර 3 - • විභක්ති ප්‍රත්‍ය හඳුන්වන්න.

පියවර 4 - • උදාහරණ ඇසුරින් විභක්ති ප්‍රත්‍යවල අර්ථ පැහැදිලි කර දෙන්න.

**7. මූලාශ්‍රය :** • පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- ඒකවචන පදවල බහුවචනයත්, බහුවචන පදවල ඒක වචන රූපයත් ලියයි.
- පුරුෂ වාචක නාමපද සඳහා ස්ත්‍රී වාචක පද සහ ස්ත්‍රී වාචක නාමපද සඳහා පුරුෂ වාචක පද ද ලියයි.
- පුරුෂත්‍රයට අදාළ සර්වනාම සහ ඊට අදාළ සහායක ක්‍රියා යොදයි.
- ප්‍රශ්නවාචී සර්වනාම පද භාවිත කරයි.
- कोई- අනිශ්චය වාචක සර්වනාම පදය භාවිත කරයි.
- විශේෂ්‍යයේ ලිංග, වචන, කාරක භේදය අනුව විශේෂණ භාවිත කරයි.
- විභක්ති ගැන්වීමේ දී පදවල සිදුවන වෙනස්කම් අවබෝධ කරගෙන යොදයි.

**1. නිපුණතාව** : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**2. නිපුණතා මට්ටම** : 6.2 - විධි ක්‍රියා, සහායක ක්‍රියා, ප්‍රේරණාර්ථක් ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි.

**3. කාලච්ඡේද** : 22 යි.

**4. ඉගෙනුම් ඵල** :

i. විධික්‍රියා රූප හඳුනාගෙන වාක්‍යවල යොදයි.
ii. සහායක ක්‍රියා හඳුනාගෙන භාවිත කරයි.
iii. ප්‍රේරණාර්ථක් (ප්‍රයෝජ්‍ය ක්‍රියා) හඳුනාගෙන වාක්‍යවල යොදයි.

**5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- तू , तुम, आप යන ආමන්ත්‍රණ ස්වරූපය අනුව විධික්‍රියා රූපය වෙනස් වන බව පැහැදිලි කරන්න.
- විධික්‍රියාවේ වෙනත් රූප ද ඇති බව හඳුන්වා දෙන්න.
- सकना, लगना, पड़ना, चाहिए ආදි වශයෙන් ඇති සහායක රූප හඳුන්වා දෙන්න.

**6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ආමන්ත්‍රණ විධි අනුව විධික්‍රියා ස්වරූප වෙනස් වන බව.
- සහායක ක්‍රියාවේ විවිධ ස්වරූප භාවිත කළ හැකි බව.
- ඇතැම් ක්‍රියාවල ප්‍රයෝජ්‍ය ක්‍රියා රූප දෙකක් ඇති බව.

පියවර 1 - ක්‍රියාකාරකම් ඇසුරින් විධික්‍රියා, සහායක ක්‍රියා හා ප්‍රයෝජ්‍ය ක්‍රියා හඳුන්වා දෙන්න.

පියවර 2 - කේවල, යුගල හෝ කණ්ඩායම් වශයෙන් ඉහත ක්‍රියා රූප භාවිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් ලබා දෙන්න.

**7. මූලාශ්‍රය :**

- පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- විධික්‍රියා රූප යොදා වාක්‍ය ලියයි.
- සහායක ක්‍රියා නිවැරදි ව භාවිත කරයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා යොදමින් වාක්‍ය තනයි.

**පැවරුම**

- ඉහත ක්‍රියා ප්‍රභේද පිළිබඳ දැනුම ලබා ගැනීමට අභ්‍යාස ලබා දෙන්න.

1. නිපුණතාව : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.3 - වර්තමාන කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

3. කාලච්ඡේද : 08 යි.

4. ඉගෙනුම් ඵල :

i. වර්තමාන ක්‍රියා ප්‍රභේද හඳුනාගෙන යොදයි.

ii. වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන භාවිත කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- වර්තමාන කාලයේ ක්‍රියා ප්‍රභේද වාක්‍ය නිර්මාණයේ දී යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- වර්තමාන කාලයේ විවිධ ක්‍රියා ප්‍රභේද ඇති බව.
- ක්‍රියා මූලයට විවිධ ප්‍රත්‍ය එක් කිරීම මගින් එම කාල ප්‍රභේද නිර්මාණය වන බව.
- උක්තයේ ලිංග, වචන, පුරුෂ භේදය අනුව ආඛ්‍යාතය යෙදෙන බව.

පියවර 1 - • ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ ඇසුරින් වර්තමාන කාල ක්‍රියා ප්‍රභේදයන්හි ව්‍යාකරණ රීති හඳුන්වා දී යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

පියවර 2 - • වර්තමාන කාලයේ එක් කාල ප්‍රභේදයකින් දී ඇති වාක්‍යයක් වෙනත් වර්තමාන කාල ප්‍රභේදයකට හරවා ලිවීමට උපදෙස් දෙන්න.

7. මූලාශ්‍රය : • පරිශීලන ග්‍රන්ථ

8. නිපුණතා පාදක තක්සේරුව :

- වර්තමාන කාල ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි.

1. නිපුණතාව : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.4 - අනාගත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

3. කාලච්ඡේද : 08 යි.

4. ඉගෙනුම් ඵල :

i. අනාගත කාල ක්‍රියා ප්‍රභේද හඳුනාගෙන යොදයි.

ii. අනාගත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන වාක්‍ය නිවැරදි ව ලියයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- අනාගත කාලයේ ක්‍රියා ප්‍රභේද වාක්‍ය නිර්මාණයේ දී යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- අනාගත කාලයේ විවිධ ක්‍රියා ප්‍රභේද ඇති බව.
- ක්‍රියා මූලයට විවිධ ප්‍රත්‍ය එක් කිරීමෙන් විවිධ අනාගත කාල ප්‍රභේද නිර්මාණය වන බව.
- උක්තයේ ලිංග, වචන, පුරුෂ භේදය අනුව ආඛ්‍යාතය යෙදෙන බව.

පියවර 1 -
- ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ ඇසුරින් අනාගත කාල ක්‍රියා ප්‍රභේදයන්හි ව්‍යාකරණ රීති හඳුන්වා දී යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

පියවර 2 -
- වර්තමාන කාලයෙන් දී ඇති වාක්‍ය අනාගත කාල ප්‍රභේදයන්ට හරවා ලිවීම සඳහා ක්‍රියාකාරකම් ලබා දෙන්න.

7. මූලාශ්‍රය :
- පරිශීලන ග්‍රන්ථ

8. නිපුණතා පාදක තක්සේරුව :

- අනාගත කාල ක්‍රියා භාවිත කරමින් වාක්‍ය/ ඡේද ලියයි.

1. නිපුණතාව : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.5 - අතීත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

3. කාලච්ඡේද : 22 යි.

4. ඉගෙනුම් ඵල :

i. අතීත කාල ක්‍රියා ප්‍රභේද හඳුනාගෙන භාවිත කරයි.
ii. අතීත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන අදහස් ප්‍රකාශ කරයි.
iii. ක්‍රියාවේ අකර්මක, සකර්මක භේදය හඳුනාගෙන යොදයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- අතීත කාල ක්‍රියා ප්‍රභේදවල දී ඇති සුවිශේෂී වෙනස්කම් හඳුන්වා දෙන්න.
- ने විභක්තියේ භාවිතය පිළිබඳ පැහැදිලි කර දෙන්න.
- सामान्य, आसन्न, पूर्ण, संदिग्ध, तात्कालिक, आभ्यासिक ආදි අතීත කාල ප්‍රභේද හඳුන්වා දෙන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- අතීත කාලයේ විවිධ ප්‍රභේද භාවිත වන බව.
- ක්‍රියා මූලයේ ස්වරූපය අනුව අතීත කාල ප්‍රත්‍ය ගැන්වෙන බව.
- අතීත කාල වාක්‍ය නිර්මාණයේ දී ක්‍රියාවේ අකර්මක, සකර්මක භේදය හඳුනාගත යුතු බව.
- අතීත කාල සකර්මක වාක්‍ය නිර්මාණයේ දී වාක්‍යයේ උක්තයට ने යෙදෙන බව.
- අතීත කාල සකර්මක වාක්‍ය නිර්මාණයේ දී වාක්‍යයේ කර්මයට අනුව ආඛ්‍යාතය තැබිය යුතු බව.

පියවර 1- • සාමාන්‍ය අතීත කාලය ගොඩනගා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

පියවර 2 - • අතීත කාල අකර්මක හා සකර්මක වශයෙන් වර්ග කෙරෙන ආකාරය පැහැදිලි කරන්න.

පියවර 3 - • ඉගෙනුම් උපකරණයන් භාවිත කරමින් අතීත කාල ක්‍රියා ප්‍රභේදයන්හි ඇති වෙනස්කම් පහදා දෙන්න.

පියවර 4 - • අතීත කාල වාක්‍ය භාවිත කරමින් ඡේද නිර්මාණයට යොමු කරන්න.

**7. මූලාශ්‍රය :** • පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- අතීත කාල ක්‍රියා රූප ගොඩනගයි.
- අතීත කාල ක්‍රියා භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරයි.
- මාතෘකාවකට අනුව ඡේදයක් නිර්මාණය කරයි.

**පැවරුම**

- දෙනු ලබන වර්තමාන කාල ක්‍රියාවල අතීත කාල ක්‍රියා රූපය සාදන්න.
- සාමාන්‍ය අතීත කාලයෙන් දී ඇති වාක්‍ය අතීත කාලයේ විවිධ ප්‍රභේදවලට හරවා ලියන්න.
- දී මාතෘකාවකට අනුව අතීත කාල වාක්‍ය භාවිත කරමින් ඡේද ගොඩනගන්න.

1. නිපුණතාව : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.6 - හින්දී සංඛ්‍යාංකනය පිළිබඳ අවබෝධය ලබයි.

3. කාලච්ඡේද : 06 යි.

4. ඉගෙනුම් ඵල :

i. 1-100 දක්වා පූර්ණ සංඛ්‍යා හින්දියෙන් දක්වයි.
ii. කාල, භාග, තුන්කාල ආදි අපූර්ණ සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.
iii. ක්‍රමවාචී, ගුණවාචී, යෝගවාචී සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- 5, 8, 9 යන අංකවල ඇති වෙනත් රූප ද හඳුන්වා දෙන්න.
- 1-100 සහ ඉන් ඉදිරියට එන ප්‍රධාන සංඛ්‍යා (දහස, ලක්ෂය, කෝටිය) හින්දියෙන් හඳුන්වා දෙන්න.
- 1-7 දක්වා ක්‍රමවාචී සංඛ්‍යා යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- 7 න් පසු ක්‍රමවාචී සංඛ්‍යා යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- ක්‍රමවාචී සංඛ්‍යා आ, ई, ए ලෙස රූපීය වශයෙන් වෙනස් වන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- ගුණවාචී සංඛ්‍යා සාදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- යෝගවාචී සංඛ්‍යා සාදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- හින්දියට විශේෂිත වූ අංකන ක්‍රමයක් ඇති බව.
- ඇතැම් හින්දී අංක සඳහා විකල්ප රූප ද ඇති බව.
- සංඛ්‍යා කේවල සහ විශේෂණ ලෙස භාවිත වන බව.
- දහසට වැඩි සංඛ්‍යා සීයේ ගුණිතවලින් ද දැක්විය හැකි බව.

පියවර 1 - • 1-100 දක්වා සංඛ්‍යා සිසුන්ට හඳුන්වා දෙන්න.

පියවර 2 - • 1-100 දක්වා සංඛ්‍යා හින්දී ඉලක්කමෙන් සහ අකුරෙන් ලියා දක්වන්න.

පියවර 3 - • සංඛ්‍යා භාවිත කරමින් වේලාව, වර්ෂ සහ මිළ ගණන් ප්‍රකාශ කරන ආකාරය පැහැදිලි කරන්න.

පියවර 4 - • ලේඛනයේ දී සහ භාෂණයේ දී සංඛ්‍යා භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරන්න.

7. මූලාශ්‍රය :

- පරිශීලන ග්‍රන්ථ
- ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

8. නිපුණතා පාදක තක්සේරුව :

- අංකයට අදාළ වචනය ලියා දක්වයි.
- සංඛ්‍යා ගණනය කර පෙන්වයි.
- 100 ට පසු සංඛ්‍යා ද ගණනය කරයි.
- හින්දියෙන් ගුණ කරයි.
- ක්‍රමවාචී සංඛ්‍යා ලිංග භේදය සහ වචන භේදය අනුව භාවිත කරයි.
- යෝගවාචී සංඛ්‍යා වාක්‍යවල යොදයි.

1. නිපුණතාව : 6.0 - මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

2. නිපුණතා මට්ටම : 6.7 - අව්‍ය පිළිබඳ අවබෝධය ලබයි.

3. කාලච්ඡේද : 10 යි.

4. ඉගෙනුම් ඵල :

i. සම්බන්ධ සූචක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.
ii. සමුච්චයබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.
iii. විස්මයාදිබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.
iv. ක්‍රියා විශේෂණ නිවැරදි ව භාවිත කරයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- සම්බන්ධ සූචක අව්‍ය පද පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- සම්බන්ධ සූචක අව්‍ය පද එකින් එක හඳුන්වා දෙන්න.
- සම්බන්ධ සූචක අව්‍ය පද නාම, සර්වනාම හා ක්‍රියා නාම සමග එක්වන විට ඇතිවන වෙනස්කම් පැහැදිලි කර දෙන්න.
- සමුච්චයබෝධක අව්‍ය පද පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- සමුච්චයබෝධක අව්‍ය පද එකින් එක හඳුන්වා දෙන්න.
- සමුච්චයබෝධක අව්‍ය පද වාක්‍යවල භාවිත කරන්න.
- විස්මයාදිබෝධක අව්‍ය පද හඳුන්වා දෙන්න.
- විස්මයාදිබෝධක අව්‍ය පද වාක්‍යවල භාවිත කරන්න.
- ක්‍රියා විශේෂණ හඳුන්වන්න.
- ක්‍රියා විශේෂණ අවිකාරී බව හඳුන්වා දෙන්න.
- ක්‍රියා විශේෂණ භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- සම්බන්ධ සූචක අව්‍ය පද යෙදීමේ දී නාම, සර්වනාම හා ක්‍රියා නාමවල වෙනස්කම් ඇතිවන බව.
- මිශ්‍ර වාක්‍ය නිර්මාණයේ දී සමුච්චයබෝධක අව්‍ය පද භාවිත කළ හැකි බව.
- ක්‍රියා විශේෂණ පදවල විවිධ ප්‍රභේද ඇති බව.
- ක්‍රියා විශේෂණ පද අවිකාරී බව.

පියවර 1 - • සම්බන්ධ සූචක අව්‍ය පද නාම, සර්වනාම හා ක්‍රියා නාම පද සමග යෙදෙන විට එම පදවල ඇතිවන වෙනස්කම් පැහැදිලි කරන්න.

පියවර 2 - • සමුච්චයබෝධක සහ විස්මයාදිබෝධක අව්‍ය පද යෙදෙන ආකාරය වාක්‍ය ඇසුරින් පැහැදිලි කර දෙන්න.

පියවර 3 - • වාක්‍ය අනුසාරයෙන් ක්‍රියා විශේෂණ පද සිසුන්ට පැහැදිලි කර දෙන්න.

7. මූලාශ්‍රය : • පරිශීලන ග්‍රන්ථ

8. නිපුණතා පාදක තක්සේරුව :

- උක්ත ව්‍යාකරණ දැනුම තහවුරු කර ගැනීමට සුදුසු අභ්‍යාස ලබා දෙන්න.

1. නිපුණතාව : 7.0 - හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

2. නිපුණතා මට්ටම : 7.1 - සම්මත වර්ණමාලාව නිවැරදි ව ලියයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 30 යි.

4. ඉගෙනුම් ඵල :

i හින්දී වර්ණ මාලාවේ ස්වර ලියා දක්වයි.

ii. හින්දී වර්ණ මාලාවේ ව්‍යඤ්ජන ලියා දක්වයි.

iii. සංයුක්ත අකුරු ලියයි.

iv. ස්වර පිල්ලම් භාවිත කරමින් ලියයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- 'ලේඛන හුරුව' ග්‍රන්ථය පරිශීලනය කරන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- ස්වර හා ව්‍යංජන වශයෙන් වර්ණමාලාව බෙදෙන බව.
- හින්දී අක්ෂර ලිවීමේ දී ශිරෝරේඛාවක් යෙදෙන බව හා රේඛාවට සමපාත ව ලිවිය යුතු බව.
- පැරණි හා සම්මත ලේඛනයෙහි වෙනස්කම් ඇති බව.

පියවර 1 -

- සම්මත හින්දී වර්ණමාලාව සිසුන්ට ලබා දෙන්න.
- මුද්‍රිත අකුරු හා අත්අකුරුවල ඇති වෙනස පැහැදිලි කරන්න.
- අකුරු ලියන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න.
- පිල්ලම් හා සෙසු සම්මත ලේඛන නීති රීති පැහැදිලි කර දී වචන හා වාක්‍ය ලියවන්න.

7. මූලාශ්‍රය :

- පරිශීලන ග්‍රන්ථ

8. නිපුණතා පාදක තක්සේරුව :

- ස්වර හා ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.
- පිල්ලම් භාවිත කරමින් වචන හා වාක්‍ය නිවැරදි ව ලියයි.

1. නිපුණතාව : 7.0 - හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

2. නිපුණතා මට්ටම : 7.2 - හින්දී වර්ණමාලාව භාවිත කර නිවැරදි ව වචන ලියයි.

3. කාලච්ඡේද සංඛ්‍යාව : 10 යි.

4. ඉගෙනුම් ඵල :

i. හල් කිරීම, අනුස්වාරය, අර්ධ අනුස්වාරය, විසර්ගය, රේඵය, උත්ක්ෂිප්ත ධ්වනි, රකාරාංශය භාවිත කරමින් වචන ලියයි.

5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :

- 'ලේඛන හුරුව' ග්‍රන්ථය පරිශීලනය කරන්න.

6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

- හින්දී වචන ලිවීමේ දී ශිරෝරේඛාවක් යෙදෙන බව.
- වචනය ලිවීමෙන් අනතුරු ව ශිරෝරේඛාව යෙදිය යුතු බව.
- පිල්ලම් පිළිබඳ ව සැලකිලිමත් වෙමින් වචන ලිවිය යුතු බව.

පියවර 1 -

- සම්මත හින්දී වර්ණමාලාව සිසුන්ට ලබා දෙන්න.
- පිල්ලම් යෙදීම පැහැදිලි කර දෙන්න.
- පිල්ලම් යෙදීමේ ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

7. මූලාශ්‍රය :

- පරිශීලන ග්‍රන්ථ

8. නිපුණතා පාදක තක්සේරුව :

- පිල්ලම් යෙදීමේ අභ්‍යාසවල යොදවන්න.

**1. නිපුණතාව** : 7.0 - හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**2. නිපුණතා මට්ටම** : 7.3 - හින්දියෙන් වාක්‍ය ලියයි.

**3. කාලච්ඡේද සංඛ්‍යාව** : 10 යි.

**4. ඉගෙනුම් ඵල** :

i. උක්තාඛ්‍යාත ගළපමින් වාක්‍ය ලියයි.

**5. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල :**

- 'ලේඛන හුරුව' සහ 'වියරණ හුරුව' ග්‍රන්ථ පරිශීලනය කරන්න.
- ලේඛන නීති රීති සහ වියරණ නීති රීති හුරු කරන්න.

**6. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- විරාමාදි ලක්ෂණ භාවිත කළ යුතු බව.
- සම්මත අක්ෂර වින්‍යාසය යොදා ගත යුතු බව.
- සම්මත ව්‍යාකරණ නීති අනුගමනය කළ යුතු බව.

පියවර 1 -

- වාක්‍ය ගොඩනැගීමට අදාළ ව්‍යාකරණ නීති හඳුන්වා දෙන්න.
- උක්තාඛ්‍යාත ගළපමින් සරල වාක්‍ය නිර්මාණය කරන්න.

**7. මූලාශ්‍රය :**

- පරිශීලන ග්‍රන්ථ

**8. නිපුණතා පාදක තක්සේරුව :**

- වාක්‍ය කිහිපයක් ලිවීමට සලස්වන්න.
- පිටපත් කිරීම් ලබා දෙන්න.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

වාරය - 1

ඇගයුම් සැලසුම් අංකය - 1

නිපුණතාව - 1.0

නිපුණතා මට්ටම - 1.1

ඇගයුම් සැලසුම් ස්වභාවය - ඉදිරිපත් කිරීම

කාලච්ඡේද - 01

ඉගෙනුම් ඵල -

- භාරතයේ ප්‍රාන්ත නම් කරයි.
- එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව නම් කරයි.
- හින්දී භාෂක කලාපය, සිතියමක නම් කරයි.

ක්‍රියාවලිය -

- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- භාරතයේ ප්‍රාන්ත, එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර වන භාෂා සහ හින්දී භාෂක කලාපය හඳුනාගෙන ලකුණු කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට තමාගේ පිළිතුර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | ප්‍රාන්ත හඳුනා ගැනීම | ප්‍රාන්තීය භාෂා හඳුනා ගැනීම | හින්දී භාෂා කලාපය හඳුනා ගැනීම | හින්දී භාෂා කලාපයේ සීමාව දක්වයි | කාල කළමනාකරණය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1

වාරය - 1

ඇගයුම් සැලසුම් අංකය - 2

නිපුණතාව - 3.0

නිපුණතා මට්ටම - 3.1

ඇගයුම් සැලසුම් ස්වභාවය - ශ්‍රවණ

කාලච්ඡේද - 02

ඉගෙනුම් ඵල -
- අල්පප්‍රාණ සහ මහප්‍රාණ අකුරුවල උච්චාරණයන්ට සවන් දී ඒවායෙහි වෙනස හඳුනාගෙන ලියා දක්වයි.
- अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරු සහ එම අකුරු සහිත වචනවල නිවැරදි උච්චාරණය හඳුනාගෙන ලියා දක්වයි.

ක්‍රියාවලිය -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- ඉහත උච්චාරණ විශේෂතා මතුකෙරෙන වචන දහයක් හෝ පහළොවක් තෝරාගන්න.
- ගුරුවරයා වචන උච්චාරණය කරන අතරතුර සිසුන්ට වචන ලිවීමට උපදෙස් දෙන්න.
- අවධානයෙන් සවන් දී උච්චාරණ විශේෂතා හඳුනාගෙන නිවැරදි ව ලිවීමට උපදෙස් දෙන්න.

- සිසුන්ට වචන ලිවීමට ගතවන කාලය ගැන සැලකිලිමත් වෙමින් වචන කියවන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | අවධානයෙන් සවන් දීම | ශබ්දය හෝ වචනය නිවැරදිව හඳුනාගැනීම | නිවැරදිව අක්ෂර භාවිත කිරීම | පිල්ලම නිවැරදිව යෙදීම | පිරිසිදු බව හා පැහැදිලි බව | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1

වාරය - 1

ඇගයුම් සැලසුම් අංකය - 3

නිපුණතාව - 4.0

නිපුණතා මට්ටම - 4.1, 4.2, 4.4

ඇගයුම් සැලසුම් ස්වභාවය - කථනය

කාලච්ඡේද - 02

ඉගෙනුම් ඵල -
- අවස්ථානුකූල ව ආචාර කරයි.
- තමාව හඳුන්වා දෙයි.
- වෙනත් අයෙකු හඳුන්වා දෙයි.
- පෞද්ගලික තොරතුරු විමසයි.

ක්‍රියාවලිය -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- ඉහත භාෂණ විධි ඇතුළත් වන ආකාරයේ මාතෘකා සිසුන්ට ලබා දෙන්න.
- මාතෘකාවට අනුව සරල සංවාදයක් ගොඩනැඟීමට උපදෙස් දෙන්න.
- සංවාදය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | අවස්ථානුකූල ව ආචාර කිරීම | තමාව හඳුන්වා දීම | වෙනත් අයකු හඳුන්වා දීම | තොරතුරු විමසයි | නිවැරදි උච්චාරණය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1

වාරය - 2

ඇගයුම් සැලසුම් අංකය - 1

නිපුණතාව - 4.0

නිපුණතා මට්ටම - 4.7

ඇගයුම් සැලසුම් ස්වභාවය - භූමිකා රංගනය

කාලච්ඡේද - 02

ඉගෙනුම් ඵල -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- මිල ගණන් විමසීම, කේවල් කිරීම, මිලදී ගැනීම සහ මුදල් හුවමාරුව යනාදිය ඇතුළත් ව සංවාදයක් ගොඩනගයි.
- නිවැරදි උච්චාරණය හා හඬ පාලනයෙන් යුතු ව භූමිකා රංගනයේ යෙදෙයි.

ක්‍රියාවලිය -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- फलों की दुकान पर යන මාතෘකාව යටතේ සරල සංවාදයක් ගොඩනගන්න.
- සංවාදය පංතිය ඉදිරියේ රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | මාතෘකානුකූල බව | නිවැරදි උච්චාරණය හා හඬ පාලනය | ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව | නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම | සාමූහිකත්වය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4
3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2
1

වාරය - 2

ඇගයුම් සැලසුම් අංකය - 2

නිපුණතාව - 6.0

නිපුණතා මට්ටම - 6.3

ඇගයුම් සැලසුම් ස්වභාවය - සංකල්ප සිතියම

කාලච්ඡේද - 02

ඉගෙනුම් ඵල -
- වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද හඳුනාගෙන නම් කරයි.
- වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් ඉදිරිපත් කරයි.
- වර්තමාන කාල ක්‍රියා ප්‍රභේදවලට උදාහරණ ඉදිරිපත් කරයි.

ක්‍රියාවලිය -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- වර්තමාන කාලය යන සංකල්පය සිසුන්ට ලබා දෙන්න.
- එහි ප්‍රභේද, සමානතා සහ අසමානතා මතු කෙරෙන සංකල්ප සිතියමක් ගොඩනැගීමට උපදෙස් දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | වර්තමාන ප්‍රභේද නම් කරයි | සමානතා හැඳින්වීම | අසමානතා හැඳින්වීම | වාක්‍ය නිවැරදි ව ගැළපීම | අක්ෂර වින්‍යාසය සහ කාල කළමනාකරණය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1

වාරය - **2**

**ඇගයුම් සැලසුම් අංකය** - 3

**නිපුණතාව** - 3.0

**නිපුණතා මට්ටම** - 3.4

**ඇගයුම් සැලසුම් ස්වභාවය** - පැවරුම (සවන් දී පිළිතුරු ලියයි.)

**කාලච්ඡේද** - **02**

**ඉගෙනුම් ඵල** -
- ඡේදයට අවධානයෙන් සවන් දෙයි.
- ප්‍රශ්න අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලියයි.

**ක්‍රියාවලිය** -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- සිසුන්ගේ භාෂා සහ ව්‍යාකරණ දැනුමට යෝග්‍ය ගද්‍ය ඡේදයක් තෝරා ගන්න.
- කෙටි පිළිතුරු අපේක්ෂා කෙරෙන ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන්න.
- ප්‍රශ්නාවලිය කියවා අවබෝධ කරගැනීමට අවස්ථාව ලබා දී අනතුරුව ඡේදය කියවන්න.
- ඡේදයට සවන් දෙන අතර පිළිතුරු ලිවීමට උපදෙස් දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | නිවැරදි ව ප්‍රශ්න අවබෝධ කරගැනීම | ව්‍යාකරණ නිවැරදි ව යෙදීම | නිවැරදි අක්ෂර වින්‍යාසය | පිරිසිදු බව හා පැහැදිලි බව | කාල කළමනාකරණය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4
3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2
1

**වාරය** - 3

**ඇගයුම් සැලසුම් අංකය** - 1

**නිපුණතාව** - 6.0

**නිපුණතා මට්ටම** - 6.6

**ඇගයුම් සැලසුම් ස්වභාවය** - පැවරුම් (ගණන සංඛ්‍යා ක්‍රමික සංඛ්‍යා බවට පෙරළයි.)

**කාලච්ඡේද** - 01

**ඉගෙනුම් ඵල** -
- සංඛ්‍යාවක් ක්‍රමවාචී සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරයි.
- ක්‍රමවාචී සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.

**ක්‍රියාවලිය** -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- 1-10 දක්වා සංඛ්‍යා යෙදෙන වාක්‍ය සිසුන්ට ඉදිරිපත් කරන්න.

උදා: माधव कक्षा एक में पढ़ता है।

रेलगाड़ी फ्लेटफोम नम्बर तीन पर आती है।

මෙම වාක්‍යවල යෙදී ඇති සංඛ්‍යා, ක්‍රමවාචී සංඛ්‍යා බවට පරිවර්තනය කර වාක්‍ය නැවත ලිවීමට උපදෙස් දෙන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | ක්‍රමාංක ප්‍රත්‍ය හඳුනා ගනියි. | ක්‍රමාංක ප්‍රත්‍ය යෙදිය යුතු සංඛ්‍යා හඳුනාගනියි. | ක්‍රමාංක ප්‍රත්‍ය නොයෙදිය යුතු සංඛ්‍යා හඳුනාගනියි. | ක්‍රමාංක සංඛ්‍යාව නිවැරදි ව ලියයි. | වාක්‍යවල නිවැරදි ව භාවිත කරයි. | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1

වාරය - 3

ඇගයුම් සැලසුම් අංකය - 2

නිපුණතාව - 6.0

නිපුණතා මට්ටම - 6.5

ඇගයුම් සැලසුම් ස්වභාවය - දින පොතක් නිර්මාණය

කාලච්ඡේද - සති 01

ඉගෙනුම් ඵල -
- තම දෛනික කටයුතු දිනපොතක සටහන් කරයි.
- අතීත කාලය නිවැරදි ව භාවිත කරයි.
- අදහස් නිවැරදි ව කෙටියෙන් ප්‍රකාශ කරයි.

ක්‍රියාවලිය -
- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- සතියක් තුළ තම දෛනික කටයුතු දිනපොතක සටහන් කිරීමට උපදෙස් දෙන්න.
- අතීත කාලය නිවැරදි ව භාවිත කළ යුතු බව පහදා දෙන්න.
- අදහස් නිවැරදි ව කෙටියෙන් ප්‍රකාශ කළ යුතු බව අවධාරණය කරන්න.

| සිසුන්ගේ නම් | නිර්ණායක | අතීත කාලය නිවැරදි ව භාවිත කරයි | යොදා ගත් වාග්කෝෂයේ ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව | නිවැරදි අක්ෂර වින්‍යාසය | නිර්මාණාත්මක බව | සමස්තය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4
3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2
1

| | | |
|---|---|---|
| වාරය | - | 3 |
| ඇගයුම් සැලසුම් අංකය | - | 3 |
| නිපුණතාව | - | 7.0 |
| නිපුණතා මට්ටම | - | 7.3 |
| ඇගයුම් සැලසුම් ස්වභාවය | - | බිත්ති පුවත්පත් |
| කාලච්ඡේද | - | සති 02 |

**ඉගෙනුම් ඵල** -

- ව්‍යාකරණානුකූල ව සහ නිර්මාණශීලි ව සරල කථා, කවි, රචනා ගොඩනගයි.
- නිර්මාණශීලී ලෙස වචන සූචියක් ඉදිරිපත් කරයි.
- සාමූහික ව කටයුතු කරයි.

**ක්‍රියාවලිය** -

- ඇගයීම් නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- බිත්ති පුවත්පතට ඇතුළත් විය යුතු විශේෂාංග පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- බිත්ති පුවත්පතට ඇතුළත් විය යුතු විශේෂාංග
  1. කතා
  2. කවි
  3. රචනා
  4. දිනපොතක සටහන්
  5. වචන සූචිය (පළතුරු, එළවළු, වර්ණ ආදිය)

| සිසුන්ගේ නම් | නිර්ණායක | මාතෘකාවට අදාළ බව | අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිතය | වියරණ නිවැරදි ව භාවිතය | නිර්මාණාත්මක බව | සාමූහිකත්වය | ලැබූ මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය

නිපුණතා මට්ටමට පැමිණ ඇත - 4

3

නිපුණතා මට්ටමට පැමිණ නැත - 2

1